# ජාතික උරුමයන් රැක ගැනීමෙහි ඇති වැදගත්කම

පුරාවස්තු යනු ජාතික සම්පතකි. යම් දේශයක අතීතය කෙසේ පැවතියේද යනුවෙන් පෙන්වා දෙන සාධක අතර පුරාවස්තු වලට හිමිවන්නේ මූලික ස්ථානයකි. එසේම පුරාවස්තු එරට සංස්කෘතියේ මූලිකාංගයකි. යම් රටක ජාතියක අනන්‍යතාවය තහවුරු කිරීමෙහිලා මෙය ඉතා වැදගත් සාධකයකි.

අවුරුදු දෙදහස් පන්සියයකට අධික ලිඛිත ඉතිහාසයක් සහිත යුගයට අයත් අමිල පුරාවස්තු මෙන්ම තවත් අවුරුදු දහස් ගණනක් ඉන් ඔබ්බට දිවයන පූර්ව ඓතිහාසික යුගයට අයත් පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික සාධකද අවුරුදු එක්ලක්ෂ විසිපන්දහසක් එහාට දිවයන අතීතයට අයත් පුරාවස්තුද ඇතුලත් මානව පරිණාමයේ විශේෂ අවස්ථාවන්ද හමුවන අපරටේ පුරාවස්තු මානව ඉතිහාසයේ සුවිශේෂී ස්ථානයක් ගනියි.

මෑත අතීතයට අයත් කෞතුක භාණ්ඩ වන වැදගත් ලේඛන, කලාකෘති, ගෘහ භාණ්ඩ, පැරණි රෙදිපිළි මෙන්ම ඉපැරණි බුදු පිළිම, පුස්කොළපොත්, පැරණි කාසි වර්ග, ස්වර්ණාභරණ, ගල් කැටයම්, ඇත්දළ සහ කළුවර කැටයම්, ලී කැටයම්, මැටි සහ පිඟන් භාණ්ඩ, පිත්තල සහ ලෝකඩ කැටයම්, මූර්ති ආදි විවිධ ස්වරූපයේ පුරාවස්තු සහ ජාතික ලේඛන මෙරටින් හොර රහසේ පිටමං කිරීමට උත්සාහ දැරීමේදී රේගුව මගින් අත්අඩංගුවට ගෙන තිබේ.



කළුවර සහ ඇත්දළ කැටයම් සහිත පුරාවස්තුවක්



සියවස් ගණනාවක් පැරණි මැටි බඳුනක්



මැණික් හා රිදී කැටයම් සහිත මෙම හක්ගෙඩිය ඉතා පැරණිය



කෞතුක වටිනාකමකින් යුතු ලෝකඩ බුදු පිළිමයක්





නුවර යුගයෙහි මුල් කාලයට අයත් මෙම ඉපැරණි රෙදිපිළි "සෝමන" නමැති කාණ්ඩයට අයත්ය



ඇත්දළ කැටයම් කළ මිට සහිත මෙම ආයුධය මැණික් ඔබ්බවා අලංකාර කර ඇති කෞතුක භාණ්ඩයකි

අද විවිධ රටවල, විශේෂයෙන්ම ආර්ථික අතින් පොහොසත් රටවල ඇතිවී තිබෙන වෙළඳපොල මෙම භාණ්ඩ මෙරටින් පිටකිරීමේ අධික ඉල්ලුමට හේතුවී තිබේ. එම නිසා මිල කළ නොහැකි අපේ සංස්කෘතික දායාදයන් මෙරටට අහිමිවීමේ තර්ජනයක් ඇතිවී තිබේ.



පැරණි පෙට්ටගම්



පැරණි අසිපත් කිහිපයක්



ඉපැරණි පුස්කොළ පොත්

ලොව ජාතීන් අතර අභිමානයෙන් යුතුව අපට ප්‍රකාශ කළ හැකි ප්‍රධානතම කරුණ වන්නේ ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන අපේ උරුමයයි. අධිරාජ්‍යවාදී යුගයේ මහා පරිමාණයෙන් සිදුවූ පුරාවස්තු සහ සංස්කෘතික දේපල කොල්ලය අද දවසේද සිදුවන්නේ අපේ සම්පත්වල අගය ගැන අවබෝධයක් නැති, අපේ සංස්කෘතිය ගැන හැඟීමක් නැති, "අපේකම" නොමැති, මුදල් සෙවීම ඒකායන අරමුණ කරගත් අපේම සමහර උදවිය නිසා බව අප අවබෝධ කරගත යුතුය. එසේම මුදලට යටවී අපේ උරුමය විනාශ කර දැමීමේ කොන්ත්‍රාත්තුව භාරගත් පිරිස් මේ පිටුපස සිටින බව අප කවුරුත් දැන සිටිය යුතුය. එම නිසා අපේ සංස්කෘතික උරුමය රැකගැනීමට අප හා එක්වන්න. එය ජාතික මෙහෙවරකි.